# නාම වරනැගීම හා නාම සාධක ප්‍රත්‍යය භාවිතය

සැකසුම
සුමිත් ධර්මශ්‍රී
ආනන්දෝදය මහ පිරිවෙණ
රඹුක්කන

# අකාරාන්ත පුල්ලිංග නාම වරනැගීම හා පද සාධනය

- පාලියෙහි අකාරාන්ත පුල්ලිංග නාම බොහොමයක් වරනැගෙන්නේ බුද්ධ ශබ්දය වැනි සාමාන්‍ය අකාරාන්ත නාමයක ස්වරූපයෙනි
- නාමපද සාධනය සඳහා උපයුක්ත වන විභක්ති ප්‍රත්‍යය 14ක් කච්චායනයෙහි දක්වා ඇත.
- **සි යො අං යො නා හි ස නං ස්මා හි ස නං ස්මිං සු**

# අකාරාන්ත පුල්ලිංග නාම වරනැගීමේදී හා පද සාධනයේදී සුවිශේෂී නාම

අත්ත ශබ්දය
රාජ ශබ්දය
සඛ(මිතුරා) ශබ්දය
බ්‍රහ්ම ශබ්දය
යුව ශබ්දය
පුම(පුරුෂයා) ශබ්දය
අද්ධ(කාලය හෝ මාර්ගය) ශබ්දය
මුද්ධ(මුදුන) ශබ්දය
සන්ත(සත්පුරුෂයා) ශබ්දය
භවන්ත(පින්වතා) ශබ්දය

# ශබ්දයන්හි වෙනස්කම් ඇති වීමට බලපා ඇති හේතු සාධක

- පාලිය ව්‍යවහාර භාෂාවක් ලෙස පැවතීම නිසා ඒ ඒ ප්‍රදේශයන්හි භාෂා භාවිතයේ විසමතාවයයි. නිදසුන් ලෙස රාජ සඛ යුව ආදී ශබ්දයන්හි රූප බාහුල්‍යය දැක්විය හැකිය.
- වාග්විද්‍යානුකූල සාධකයක් ලෙස පුරාතන ඉන්දු ආර්ය භාෂාවේ (සංස්කෘත)බලපෑම දැකගත හැකිය. ඒ අනුව සංස්කෘත රාජන් ශබ්දය අනුව පාලි රාජ ශබ්දයේත් , යුවන් ශබ්දය අනුව යුවශබ්දයේත්, බ්‍රහ්මන් ශබ්දය අනුව පාලි බ්‍රහ්ම ශබ්දය ආදී ශබ්දය පද සිද්ධ වී ඇති අයුරු නිරීක්ෂණය කළ හැකිය.

# පද සිද්ධියේදී නිර්දිෂ්ට කච්චායන සූත්‍ර

- ස්‍යා ච
- යොනමානො
- බ්‍රහ්මත්තසඛරාජාදිතො අමානං
- නාම්හි රඤ්ඤා වා
- රාජස්ස රාජු සුනංහිසු ච
- රාජස්ස රඤ්ඤො රාජිනො සෙ
- රඤ්ඤං නම්හි වා
- ස්මිම්හි රඤ්ඤෙරාජිනි

# සාම්ප්‍රදායික ව්‍යාකරණයෙහි භාවිත සංඥා විධි සූත්‍ර

- ව්‍යාකරණය සංක්ෂිප්ත කර ගැනීම සඳහාත් අවබෝධය සුකරවීම සඳහාත් මෙම සංඥා විධි සූත්‍ර භාවිත කර ඇති බව පැහැදිලි වෙයි.
- ආලපනෙ සි ගසඤ්ඤො (ආලපන විභක්තියෙහිදී සි විභක්තිය ග යන සංඥාවෙන් හඳුන්වනු ලබයි)

- ඉවණ්ණුවණ්ණාජ්ඣලා (පුල්ලිංගයෙහි ඉවර්ණාන්ත ශබ්ද හා උවර්ණාන්ත ශබ්ද පිළිවෙළින් ඣ හා ල යන සංඥාවන්ගෙන් හ÷න්වනු ලබයි.)
- තෙ ඉත්ථීඛ්‍යා පො (ස්ත්‍රී ලිංගයෙහි ඉවර්ණාන්ත ශබ්ද හා උවර්ණාන්ත
  - ශබ්ද ප යන සංඥාවෙන් හ÷න්වනු ලබයි.)
- ආ ඝො ( ස්ත්‍රී ලිංගයෙහි ආකාරාන්ත ශබ්ද ඝ යන සංඥාවෙන් හ÷න්වනු ලබයි.)
- මෙම සංඥා විධි සූත්‍රයන්හි අර්ථය නොදැන බාලාවතාර ආදී සාම්ප්‍රදායික ව්‍යාකරණයන්හි **ඝපතො යොනං ලොපො, ඣලපා රස්සං** වැනි සූත්‍ර තේරුම් ගැනීම ද අපහසුය.